විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය | தலைமுறையொன்றின் பெருமிதம் | Pride of a Generation


මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 02/2023

ඔබේ අංකය / உமது இல. / Your No. } ........................

දිනය / திகதி / Date } 2023.02.27

සියලුම විදේශ දූත මණ්ඩල කාර්යාල ප්‍රධානීන්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>නාවික යාත්‍රා හා මුහුදු ආරක්ෂක සේවයේ නියුතු රජයේ විශ්‍රාමිකයින් සඳහා විශ්‍රාම වැටුප් හා දීමනා ගෙවීම</u>**

2018.06.20 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/2018 වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

02. මුහුදු ආරක්ෂක සේවය හෝ නාවික යාත්‍රාවල සේවය සඳහා හෝ පිටත් වන විශ්‍රාමිකයන් මෙරටින් බැහැර වීමට ප්‍රථම සිය ජීවිත සහතිකය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දිය හැකි ය. එසේ නොමැති නම් ගොඩ බසින රටක පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලයක් හරහා හෝ වෙළඳ නාවික ලේකම් කාර්යාලය හරහා හෝ සහතික කර ලබා ගත් ජීවිත සහතික ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ඉදිරිපත් කළ හැකි ය. එසේ ජීවිත සහතිකය නියමිත කාලය තුළ ලබා නොදුනහොත් ඔහුගේ /ඇයගේ විශ්‍රාම වැටුප් ගෙවීම තාවකාලිකව නැවැත්විය යුතු අතර විශ්‍රාමිකයා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ ජීවිත සහතිකය ලබා දීමෙන් අනතුරුව පමණක් නැවත ගෙවීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතු ය.

03. රැකියා අවශ්‍යතාව මත විදේශගත වන විශ්‍රාමිකයින් සඳහා විදේශ ගත වන දින සිට නැවත මෙරටට පැමිණෙන දින තෙක් ජීවන වියදම් දීමනාව ලෙස ගෙවිය හැක්කේ රු. 2,000/-ක දීමනාව පමණි. එ මෙන්ම විදේශගත කාල සීමාව සඳහා රු.5,000/- දීමනාව ගෙවිය නොහැක. මෙම විධිවිධාන නාවික කටයුතු සඳහා හෝ මුහුදු ආරක්ෂක කටයුතු සඳහා හෝ විදේශගත වන විශ්‍රාමිකයින් සඳහා ද එකසේ අදාළ වේ.

04. ඉහත උපදෙස් පරිදි අදාළ ගෙවීම් සිදු කරන ලෙස විශ්‍රාම වැටුප් ගෙවීම් කටයුතු හා සම්බන්ධ නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

**ඒ. ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

01. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු ,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
02. ලේකම්, විදේශ කටයුතු අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස